JMC vLearning
"your virtual learning partner"

# පෙරසැරි පිරිවැයකරණය

## AAT අදියර III
## MAF - කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
## Pack 01

උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# පරිච්ඡේදය 3

# පෙරසැරි පිරිවැයකරණය
# Process Costing

මෙය අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණයට අයත් එක් පිරිවැයකරණ ක්‍රමයකි. අඛණ්ඩ නිෂ්පාදන මෙහෙයුමක් තුළින්, එක සමාන අයිතම් මහා පරිමාණ වශයෙන් නිෂ්පාදනය කරන ආයතන විසින් පෙරසැරි පිරිවැයකරණය භාවිත කරයි. මෙම නිෂ්පාදන මෙහෙයුම තුළ පෙරසැරි නැතහොත් ක්‍රියාවලීන් කීපයක් ඇතුලත් විය හැක. මෙහිදී නිෂ්පාදන ලෙස නිමවීමට, අමුද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් වලට පෙරසැරි දෙකක් හෝ කීපයක් පසු කිරීමට සිදුවේ. නිදසුන් ලෙස, ඇඟළුම්, සබන්, බිස්කට්, තීන්ත, සිමෙන්ති, රසායන ද්‍රව්‍ය, බෙහෙත් වර්ග, පුවත් පත්, විදුලි උපකරණ මෙන්ම තෙල් පිරිපහදුව, කිරි ආශ්‍රිත නිෂ්පාදන වැනි කර්මාන්ත වල නියැලුනු සමාගම් මෙම පිරිවැයකරණ ක්‍රමය භාවිත කරයි. ඇඟළුම් කම්හලකට සම්බන්ධ පෙරසැරි ක්‍රියාත්මක වන ආකාරය, පහත රූපය මගින් ඉදිරිපත් කර ඇත.




**ඇඟළුම් කම්හලක නිෂ්පාදන මෙහෙයුම**

ඉහත රූපය මගින් ඉදිරිපත් කර ඇති පරිදි භාණ්ඩය නිමවන තුරු එක් පෙරසැරියක නිමවුම, ඊළඟ පෙරසැරියෙහි යෙදවුම (මූලික අමුද්‍රව්‍ය) වේ. මේ ආකාරයට ගමන් කර, අවසාන පෙරසැරිය තුළින් අවසාන නිමවුම පිටතට පැමිණේ.

### කාර්යය පිරිවැයකරණය හා පෙරසැරි පිරිවැයකරණය සැසඳීම

**Job Costing Vs. Process Costing**

| කාර්යය පිරිවැයකරණය | පෙරසැරි පිරිවැයකරණය |
|---|---|
| (1) ගණුදෙනුකරුවෙකුගේ විශේෂ ඇනවුමක් මත නිෂ්පාදනය සිදු වේ. | (1) ඉල්ලුමක් අපේක්ෂාවෙන් අඛණ්ඩ මෙහෙයුමක් තුළින් නිෂ්පාදනය සිදුවේ. |
| (2) නිෂ්පාදන එකිනෙකට වෙනස් වේ. (Unique products) | (2) නිෂ්පාදන සෑම අතින්ම සමාන වේ. (Uniform products) |
| (3) කෙරීගෙන යන වැඩ තිබීමට හෝ නොතිබීමට ඉඩ තිබේ. | (3) කාලපරිච්ඡේදයේ ආරම්භයේදී හෝ අවසානයේදී කෙරීගෙන යන වැඩ පවතී. |
| (4) ඒ ඒ කාර්යය සඳහා පිරිවැය එක් රැස් කෙරේ. | (4) ඒ ඒ පෙරසැරිය සඳහා පිරිවැය එක්රැස් කෙරේ. |
| (5) ඒ ඒ කාර්යයේ පිරිවැය වෙන වෙනම ගණනය කළ යුතුය. | (5) සමස්ථයක් ලෙස පෙරසැරිය සඳහා වූ පිරිවැය ගණනය කෙරේ. |
| (6) ඒ ඒ කාර්යයේ පිරිවැය වෙන වෙනම ගණනය කළ යුතු නිසා, වැඩ අධික වේ. | (6) සමස්ථයක් ලෙස ගණනය කරන හෙයින් වැඩ අවම වේ. |
| (7) ව්‍යාපාරික ස්ථානයේදී හෝ ගණුදෙනුකරුගේ ස්ථානයේදී කාර්යය ඉටුකිරීම සිදු වේ. | (7) සමාගමේ පරිශ්‍රයේදී පමණක් සිදු කෙරේ. |

## පෙරසැරියක් තුළ අපතයන් හා ලාභ (Losses and gains in process)

ද්‍රව්‍ය පෙරසැරියට යොමුකළ විට, එහි ප්‍රතිඵලයක් ලෙස ඒවායේ ප්‍රමාණය හෝ බර වැඩිවීම හෝ අඩුවීම සිදු වේ.

### සාමාන්‍ය අපතය (Normal Losses)

යෙදවුම් කරන අමුද්‍රව්‍ය වල හෝ පෙරසැරියෙහි ස්වභාවය මත, ඇතැම් අපතයන් ආවේණික හා වැලැක්විය නොහැකි වේ. මෙම අපතය, සාමාන්‍ය අපතය හෙවත් සාමාන්‍ය නාස්ථිය ලෙස හැඳින්වේ. සාමාන්‍ය තත්වයන් තුළ මෙම අපතයන් බලාපොරොත්තු වේ. එනම්, කළමනාකරණය ඔවුන්ගේ පසුගිය අත්දැකීම් අනුව එම අපතය ප්‍රතිශතයක් ලෙස බලාපොරොත්තු වේ. මෙම සාමාන්‍ය අපතයට අදාළ පිරිවැය, හොඳ නිෂ්පාදනය මගින් දරාගත යුතුය. අනෙක් අතට, සාමාන්‍ය අපතය විකුණාගත හැකි නම්, එම වටිනාකම පිරිවැය නැවත ලැබීමක් සේ සලකා දැරූ පිරිවැයෙන් අඩුකළ යුතු අතර එහෙයින් එම වටිනාකම පෙරසැරියේ පිරිවැය අඩුකිරීමට හේතු වේ. සාමාන්‍ය අපතය උපලබ්ධියෙන් ලැබෙන වටිනාකම, එහි "සුන්බුන් අගය" (Scrap Value) ලෙස හැඳින්වේ. එනම්;

| | |
|---|---|
| දළ පෙරසැරි පිරිවැය | XXX |
| (-) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය | (XX) |
| ∴ ශුද්ධ පෙරසැරි පිරිවැය | XXX |

පෙරසැරි පිරිවැයකරණයේදී සාමාන්‍ය අපතයේ පිරිවැය සෙවීම නිෂ්ඵල කටයුත්තක් වන අතර එය ගිණුම්ගත කරන එකම වටිනාකම වන්නේ එහි සුන්බුන් අගයයි.

**උදාහරණ : 01**

ආහාර නිෂ්පාදනය කරන පෙරසැරියක සාමාන්‍ය අපතය එහි යෙදවුම් වලින් 10% කි. මේවා කිලෝ එකක් රු. 5/= බැගින් සත්ව ආහාරයක් ලෙස විකුණාගත හැක. යම් කාලපරිච්ඡේදයක් සඳහා ඉහත පෙරසැරියට අදාළව පහත දත්ත සටහන් වී තිබුණි.

යෙදවුම් :
අමුද්‍රව්‍ය කිලෝවක් රු. 20 බැගින් කිලෝග්‍රෑම් 1,000 ක්
ශ්‍රමය හා පොදුකාර්ය පිරිවැය රු. 25,500 කි.
සත්‍ය අපතය බලාපොරොත්තු මට්ටමට සිදුවිය.
නිමවුම් කිලෝවක පිරිවැය ගණනය කරන්න.

**පිළිතුර :**

| **ඒකක** | **කිලෝ** |
|---|---|
| යෙදවුම් | 1,000 |
| (-) සාමාන්‍ය අපතය (10%) | 100 |
| බලාපොරොත්තු නිෂ්පාදනය | 900 |



**Upul Abeysooriya** [BSc(Bus. Admin), ACA, ACMA]

| **පිරිවැය** | | **රු.** |
|---|---|---|
| යෙදවුම් | - අමුද්‍රව්‍ය (1000 Kgs @ රු. 20/=) | 20,000 |
| | - ශ්‍රමය හා පොදුකාර්ය | 25,500 |
| | දළ පෙරසැරි පිරිවැය | 45,500 |
| (-) | සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය (100 @ රු. 5/=) | 500 |
| | ∴ ශුද්ධ පෙරසැරි පිරිවැය | 45,000 |

∴ නිමවුම් කිලෝවක පිරිවැය $= \frac{45,000}{900}$

= රු. 50

**අසාමාන්‍ය අපතය / අසාමාන්‍ය පාඩුව (Abnormal Loss)**

ඇතැම් අවස්ථා වලදී, සාමාන්‍ය අපතයට වඩා සත්‍ය අපතය වැඩි වේ. සාමාන්‍ය අපතය ඉක්මවා ගිය සත්‍ය අපතය, "අසාමාන්‍ය අපතය" ලෙස සැලකේ; හෙවත් අමතර අපතය වේ. හදිසි සිදුවීම්, බාල අමුද්‍රව්‍ය, සේවකයන්ගේ නොසැලකිල්ල වැනි හේතු නිසා අසාමාන්‍ය අලාභ ඇති වේ. අසාමාන්‍ය අපතය පාලනය කළ හැකි නැතහොත් වැලැක්විය හැකි වේ. පිරිවැයකරණය තුළ සාමාන්‍ය අපතයේ සහ අසාමාන්‍ය අපතයේ බලපෑම එකිනෙකට වෙනස් වේ. සාමාන්‍ය අපතයේ පිරිවැය, හොඳ නිෂ්පාදනය විසින් දරාගනු ලැබුවද, අසාමාන්‍ය අපතයේ පිරිවැය හොඳ නිෂ්පාදනය විසින් දරාගනු නොලැබේ. හොඳ නිෂ්පාදන ඒකක මෙන්ම, අසාමාන්‍ය අපතය ද අගය කරනුයේ ඒවායේ පිරිවැයටයි. එනම් හොඳ නිෂ්පාදනය අගය කිරීම සඳහා භාවිතා කරන ඒකකයක පිරිවැය, අසාමාන්‍ය අපතය අගය කිරීම සඳහා ද භාවිත වේ.

**උදාහරණ : 02**
ඉහත ආහාර නිෂ්පාදන සමාගමේ, සත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 880 ක් වූයේ නම්,

| | **කිලෝ** |
|---|---|
| යෙදවුම් | 1,000 |
| (-) සාමාන්‍ය අපතය (10%) | 100 |
| බලාපොරොත්තු නිෂ්පාදනය | 900 |
| සත්‍ය නිෂ්පාදනය | 880 |
| ∴ අසාමාන්‍ය පාඩුව | 20 |

හෝ

| | **කිලෝ** |
|---|---|
| සාමාන්‍ය අපතය | 100 |
| සත්‍ය අපතය | 120 |
| ∴ අසාමාන්‍ය පාඩුව | 20 |

එමනිසා, අසාමාන්‍ය අපතයේ වටිනාකම = කිලෝ 20 x රු. 50

= රු. 1,000

**අසාමාන්‍ය ලාභය (Abnormal gain)**

සත්‍ය අපතය, සාමාන්‍ය හෙවත් බලාපොරොත්තු අපතයට වඩා අඩුනම් එම වෙනස අසාමාන්‍ය ලාභය ලෙස හැඳින්වේ. වෙනත් වචන වලින් කිවහොත්, අසාමාන්‍ය ලාභයක් ඇතිවන්නේ, බලාපොරොත්තු නිෂ්පාදනයට වඩා සත්‍ය නිෂ්පාදනය වැඩි වූ විටයි. අසාමාන්‍ය අපතය සේම, අසාමාන්‍ය ලාභය ද අගය කරනුයේ එහි පිරිවැයටයි.

**උදාහරණ : 03**

ඉහත ආහාර නිෂ්පාදන සමාගමේ, සත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 920 ක් වූයේ නම්,

| | **කිලෝ** |
|---|---|
| යෙදවුම් | 1,000 |
| (-) සාමාන්‍ය අපතය (10%) | 100 |
| බලාපොරොත්තු නිෂ්පාදනය | 900 |
| සත්‍ය නිෂ්පාදනය | 920 |
| ∴ අසාමාන්‍ය පාඩුව | 20 |

**හෝ**

| | **කිලෝ** |
|---|---|
| සාමාන්‍ය අපතය | 100 |
| සත්‍ය අපතය | 80 |
| ∴ අසාමාන්‍ය ලාභය | 20 |

එමනිසා, අසාමාන්‍ය ලාභයේ වටිනාකම = කිලෝ 20 x රු. 50
= රු. 1,000

## පෙරසැරි ගැටළු විසඳන ආකාරය

මූලික පෙරසැරි ගැටළුවක් විසඳීමේදී පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

**පියවර 1** පෙරසැරිය තුළ තොග දී ඇත්දැයි බලන්න. (සාමාන්‍යයෙන් පෙරසැරියක් තුළ තිබිය හැක්කේ කෙරීගෙන යන ඒකක පමණි). තොග දී නොමැති නම් පහත පියවර අනුගමනය කරන්න.

**පියවර 2** යෙදවුම් වලින් සාමාන්‍ය අපතය අඩුකොට බලාපොරොත්තු නිෂ්පාදනය ලබාගන්න.

**පියවර 3** එලෙස ගණනය කළ බලාපොරොත්තු නිෂ්පාදනය සමග සත්‍ය නිෂ්පාදනය සසඳා අසාමාන්‍ය ලාභය හෝ අසාමාන්‍ය පාඩුව හඳුනා ගන්න.

| | **ඒකක** |
|---|---|
| යෙදවුම් | XXX |
| (-) සාමාන්‍ය අපතය | (XX) |
| බලාපොරොත්තු නිෂ්පාදනය | XXX |
| සත්‍ය නිෂ්පාදනය | XXX |
| ∴ අසාමාන්‍ය ලාභය / අසාමාන්‍ය පාඩුව | XX |

**පියවර 4** පෙරසැරිය වෙනුවෙන් දරන ලද සියලුම පිරිවැය එකතු කොට දළ පෙරසැරි පිරිවැය ලබාගන්න. (විචල්‍ය / ස්ථාවර හා ඍජු / වක්‍ර)

**පියවර 5** දළ පෙරසැරි පිරිවැයෙන්, සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය අඩුකොට පහත පරිදි ශුද්ධ පෙරසැරි පිරිවැය ලබාගන්න.

| | |
|---|---|
| මූලික අමුද්‍රව්‍ය | XX |
| අතිරේඛ අමුද්‍රව්‍ය | XX |
| ඍජු වැටුප් | XX |
| ඍජු වියදම් | XX |
| නිෂ්පාදන පොදුකාර්ය | XX |
| දළ පෙරසැරි පිරිවැය | XXX |
| (-) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය | (XX) |
| ∴ ශුද්ධ පෙරසැරි පිරිවැය | XXX |

**පියවර 6** ඉහත පරිදි ගණනය කළ ශුද්ධ පෙරසැරි පිරිවැය, බලාපොරොත්තු නිෂ්පාදනයෙන් බෙදා ඒකකයක පිරිවැය ලබා ගන්න.

$$\text{ඒකකයක පිරිවැය} = \frac{\text{ශුද්ධ පෙරසැරි පිරිවැය}}{\text{බලාපොරොත්තු නිෂ්පාදනය}}$$

**පියවර 7** ඉහත ගණනය කළ ඒකකයක පිරිවැය, සත්‍ය නිෂ්පාදනයෙන් ගුණකොට, ඊළඟ පෙරසැරියට නැතහොත් නිමි තොගයට මාරුකරන පිරිවැය ලබාගන්න.

$$\text{මාරුකරන පිරිවැය} = \text{ඒකකයක පිරිවැය} \times \text{සත්‍ය නිෂ්පාදනය}$$

**පියවර 8** පෙරසැරි ගිණුම් සකස් කරන්න.

- පෙරසැරි ගිණුම්
- සාමාන්‍ය අපතය ගිණුම්
- අසාමාන්‍ය අපතය හෝ අසාමාන්‍ය ලාභ ගිණුම්

**උදාහරණ : 04**

යම් භාණ්ඩයක් පෙරසැරි I හා පෙරසැරි II නමින් පෙරසැරි 2 ක් පසුකර නිමි තොගයට මාරු වේ. ඒ ඒ පෙරසැරියට අදාළ සාමාන්‍ය අපතයන් පහත පරිදි වේ.

පෙරසැරි I - යෙදවුම් වලින් 10%
පෙරසැරි II - යෙදවුම් වලින් 5%

පෙරසැරි I හි අපතය ඒකකයක් රු. 0.40 බැගින් ද, පෙරසැරි II හි අපතය ඒකකයක් රු. 0.50 බැගින් ද අලෙවි කර ගත හැක. ඒකකය රු. 0.62 බැගින් ඒකක 10,000 ක් පෙරසැරි I ට යෙදවුම් කර ඇත.

අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

| | | **එකතුව** | **පෙරසැරි I** | **පෙරසැරි II** |
|---|---|---|---|---|
| අතිරේඛ අමුද්‍රව්‍ය | (රු.) | 18,000 | 8,500 | 9,500 |
| ඍජු ශ්‍රමය | (රු.) | 10,000 | 4,000 | 6,000 |
| ඍජු වියදම් | (රු.) | 2,130 | 1,200 | 930 |
| ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය | (රු.) | 7,500 | | |
| සත්‍ය නිෂ්පාදනය | (ඒකක) | | 9,200 | 8,700 |

- ඍජු ශ්‍රම පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කළ යුතු වේ.
- කිසිම පෙරසැරියක ආරම්භක හෝ අවසාන කෙරීගෙන යන වැඩ නොතිබුණි.

පෙරසැරි ගිණුම් හා අදාළ අනෙකුත් ගිණුම් සකස් කරන්න.


**Upul Abeysooriya** [BSc(Bus. Admin), ACA, ACMA]

**පිළිතුර :**

**පෙරවැඩ :**

**සටහන (1)**

**නිෂ්පාදන ඒකක හා පිරිවැය ප්‍රකාශය**

| | **පෙරසැරි I** | **පෙරසැරි II** | |
|---|---|---|---|
| යෙදවුම් | 10,000 | 9,200 | |
| (-) සාමාන්‍ය අපතය | (1,000) | (460) | |
| බලාපොරොත්තු නිෂ්පාදනය | 9,000 | 8,740 | නිෂ්පාදන ඒකක පියවර (2) හා (3) |
| සත්‍ය නිෂ්පාදනය | 9,200 | 8,700 | |
| ∴ අසාමාන්‍ය ලාභය | 200 | | |
| ∴ අසාමාන්‍ය පාඩුව | | 40 | |
| **පිරිවැය :** | **රු.** | **රු.** | |
| මූලික අමුද්‍රව්‍ය | 6,200 | 23,000 | |
| අතිරේඛ අමුද්‍රව්‍ය | 8,500 | 9,500 | |
| ඍජු ශ්‍රමය | 4,000 | 6,000 | |
| ඍජු වියදම් | 1,200 | 930 | |
| ස්ථාවර නිෂ්පාදන පො/කා (සටහන 2) | 3,000 | 4,500 | |
| දළ පෙරසැරි පිරිවැය | 22,900 | 43,930 | පිරිවැය ප්‍රකාශය පියවර (4), (5), (6) සහ (7) |
| (-) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය | (400) | (230) | |
| ශුද්ධ පෙරසැරි පිරිවැය | 22,500 | 43,700 | |
| ඒකකයක පිරිවැය | 22,500/9,000 | 43,700/8,740 | |
| | 2.50 | 5 | |
| ∴ සත්‍ය නිෂ්පාදනයේ මුළු පිරිවැය | 2.50 x 9,200 | 5 x 8,700 | |
| | 23,000 | 43,500 | |

**සටහන (2) :** ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය අන්තර්ග්‍රහණය (ඍජු ශ්‍රම පිරිවැය මත)

පෙරසැරි I - $7,500 \times \frac{4,000}{10,000}$ = රු. 3,000

පෙරසැරි II - $7,500 \times \frac{6,000}{10,000}$ = රු. 4,500

**විවෘත කළ යුතු ගිණුම් (ඉහත නිදසුනට අදාළව)**

පෙරසැරි I - ගිණුම
පෙරසැරි I - සාමාන්‍ය අපතය ගිණුම
පෙරසැරි I - අසාමාන්‍ය ලාභ ගිණුම
පෙරසැරි II - ගිණුම
පෙරසැරි II - සාමාන්‍ය අපතය ගිණුම
පෙරසැරි II - අසාමාන්‍ය පාඩු ගිණුම

පෙරසැරි I

| | | ඒකක | මිල | වටිනාකම (රු.) | | | ඒකක | මිල | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | ඉ/ශෙ | - | - | - | (3) | සාමාන්‍ය අපතය | 1,000 | 0.40 | 400 |
| (2) | මූලික අමුද්‍රව්‍ය | 10,000 | 0.62 | 6,200 | (5) | පෙරසැරි II ට මාරු | 9,200 | 2.50 | 23,000 |
| (2) | අතිරේඛ අමුද්‍රව්‍ය | | | 8,500 | | | | | |
| (2) | ඍජු ශ්‍රමය | | | 4,000 | | | | | |
| (2) | ඍජු වියදම් | | | 1,200 | | | | | |
| (2) | නිෂ්. පො/කා | | | 3,000 | | | | | |
| (4) | අසාමාන්‍ය ලාභ | 200 | 2.50 | 500 | (6) | ප/ශෙ | - | - | - |
| | | 10,200 | | 23,400 | | | 10,200 | | 23,400 |

පෙරසැරි I - සාමාන්‍ය අපතය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (3) | පෙරසැරි I | 1,000 | 0.40 | 400 | (7) | අසාමාන්‍ය ලාභ | 200 | 0.40 | 80 |
| | | | | | (9) | මුදල් | 800 | 0.40 | 320 |
| | | 1,000 | | 400 | | | 1,000 | | 400 |

පෙරසැරි I - අසාමාන්‍ය ලාභ

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (7) | සාමාන්‍ය අපතය | 200 | 0.40 | 80 | (4) | පෙරසැරි I | 200 | 2.50 | 500 |
| (8) | පිරිවැය ලා/ලා | | | 420 | | | | | |
| | | 200 | | 500 | | | 200 | | 500 |

පෙරසැරි II

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | ඉ/ගෙ | - | - | - | | සාමාන්‍ය අපතය | 460 | 0.50 | 230 |
| (5) | පෙරසැරි I න් මාරු | 9,200 | 2.50 | 23,000 | (10) | අසාමාන්‍ය පාඩුව | 40 | 5 | 200 |
| | අතිරේඛ අමුද්‍රව්‍ය | | | 9,500 | (11) | නිමිතොගයට මාරු | 8,700 | 5 | 43,500 |
| | සෘජු ශ්‍රමය | | | 6,000 | | | | | |
| | සෘජු වියදම් | | | 930 | | | | | |
| | නිෂ්පාදන පො/කා | | | 4,500 | | ප/ගෙ | - | | - |
| | | 9,200 | | 43,930 | | | 9,200 | | 43,930 |

පෙරසැරි II - සාමාන්‍ය අපතය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙරසැරි II | 460 | 0.50 | 230 | | මුදල් | 500 | 0.50 | 250 |
| (12) | අසාමාන්‍ය පාඩු | 40 | 0.50 | 20 | | | | | |
| | | 500 | | 250 | | | 500 | | 250 |

පෙරසැරි II - අසාමාන්‍ය පාඩු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (10) | පෙරසැරි II | 40 | 5 | 200 | (12) | සාමාන්‍ය අපතය | 40 | 0.50 | 20 |
| | | | | | (13) | පිරිවැය ලා/ලා | | | 180 |
| | | 40 | | 200 | | | 40 | | 200 |

**ද්විත්ව සටහන් :**

(1) ආරම්භක නොනිමි තොගයේ වටිනාකම (පිරිවැය) අදාළ පෙරසැරි ගිණුමෙන් ඉදිරියට (හර) ගෙන ආ යුතුය.

(2) පෙරසැරිය වෙනුවෙන් දැරූ සියලුම පිරිවැය

පෙරසැරි ගිණුම — හර

අදාළ පිරිවැය පාලන ගිණුම් — බැර

(3) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය

සාමාන්‍ය අපතය ගිණුම — හර

පෙරසැරි ගිණුම — බැර

(4) පෙරසැරි I හි අසාමාන්‍ය ලාභය (පිරිවැයට)

පෙරසැරි ගිණුම — හර

අසාමාන්‍ය ලාභ ගිණුම — බැර

(5) පෙරසැරි I හි සත්‍ය නිෂ්පාදනය පෙරසැරි II ට මාරු කිරීම (පිරිවැයට)

පෙරසැරි II ගිණුම — හර

පෙරසැරි I ගිණුම — බැර

(6) අවසාන කෙරීගෙන යන වැඩවල පිරිවැය පෙරසැරි ගිණුමෙන් පහළට (බැර) ගෙන යා යුතුය.

(7) අසාමාන්‍ය ලාභය තුළ සැඟවුනු පාඩුව
අසාමාන්‍ය ලාභය හේතුවෙන්, අපතය එම ප්‍රමාණයෙන් අඩුවේ. එම අඩුවූ අපතයේ කැපකළ සුන්බුන් අගය මේ නමින් හැඳින්වේ.

| | | |
|---|---|---|
| අසාමාන්‍ය ලාභ ගිණුම | හර | |
| සාමාන්‍ය අපතය ගිණුම | | බැර |

(8) අසාමාන්‍ය ලාභ ගිණුමේ ශේෂය පිරිවැය ලාභාලාභ ගිණුමට මාරු කරන්න.

| | | |
|---|---|---|
| අසාමාන්‍ය ලාභ ගිණුම | හර | |
| පිරිවැය ලාභාලාභ ගිණුම | | බැර |

(9) සත්‍ය අපතය විකුණා ලැබෙන මුදල්

| | | |
|---|---|---|
| මුදල් | හර | |
| සාමාන්‍ය අපතය | | බැර |

(10) පෙරසැරි II හි අසාමාන්‍ය පාඩුව (පිරිවැයට)

| | | |
|---|---|---|
| අසාමාන්‍ය පාඩු ගිණුම | හර | |
| පෙරසැරි ගිණුම | | බැර |

(11) පෙරසැරි II හි සත්‍ය නිෂ්පාදනය, නිමි තොග පාලන ගිණුමට මාරු කිරීම (පිරිවැයට)

| | | |
|---|---|---|
| නිමිතොග පාලන ගිණුම | හර | |
| පෙරසැරි II ගිණුම | | බැර |

(12) අසාමාන්‍ය පාඩුව තුළ සැඟවුනු ලාභය
එනම් අමතර අපතයට අදාළ සුන්බුන් අගය වේ.

| | | |
|---|---|---|
| සාමාන්‍ය අපතය ගිණුම | හර | |
| අසාමාන්‍ය පාඩු ගිණුම | | බැර |

(13) අසාමාන්‍ය පාඩු ගිණුමේ ශේෂය, පිරිවැය ලාභාලාභ ගිණුමට මාරු කරන්න.

| | | |
|---|---|---|
| පිරිවැය ලාභාලාභ ගිණුම | හර | |
| අසාමාන්‍ය පාඩු ගිණුම | | බැර |

**උදාහරණ : 05**

පෙරසැරි 3 ක් පසු කරන X නම් භාණ්ඩය පිළිබඳ පසුගිය සතියේ විස්තර මෙසේය.

| | **සමස්ථ පිරිවැය** | **පෙරසැරි 1** | **පෙරසැරි 11** | **පෙරසැරි 111** |
|---|---|---|---|---|
| ඍජු ද්‍රව්‍ය | 8,482 | 2,000 | 3,020 | 3,462 |
| ඍජු වේතන | 12,000 | 3,000 | 4,000 | 5,000 |
| ඍජු වියදම් | 726 | 500 | 226 | - |
| නිෂ්පාදන පොදුකාර්ය | 6,000 | | | |

ඒකකයක් රු. 5/= ක් වටිනා ඒකක 1,000 ක් අංක 1 පෙරසැරියට යොමුකළ අතර එක් එක් පෙරසැරියේ නිෂ්පාදනය මෙසේය.

| | | |
|---|---|---|
| අංක 1 පෙරසැරිය | 920 | |
| 11 පෙරසැරිය | 870 | |
| 111 පෙරසැරිය | 800 | |

සාමාන්‍ය අපතය සහ අපතයේ ඒකකයක් අලෙවි කරගත හැකි මිල මෙසේය.

අංක 1 පෙරසැරිය 10%, එකක් රු. 3 ක් ගණනේ
11 පෙරසැරිය 5%, එකක් රු. 5 ක් ගණනේ
111 පෙරසැරිය 10%, එකක් රු. 6 ක් ගණනේ

**කිසිදු පෙරසැරියක ආරම්භක / අවසාන කෙරීගෙන යන වැඩ නොමැති සේ සලකා සියලු ගිණුම් සකස් කරන්න.**

## අවසාන නොනිම් තොග (Closing Work-in-Progress)

ඉහත පැහැදිලි කර පරිදි, පෙරසැරියක තොග යනු කෙරීගෙන යන වැඩ වේ.

කාලපරිච්ඡේදයක අග දිනට සම්පූර්ණ නොකළ ඒකක ඇත්නම්, ඒවා අවසාන නොනිම් වැඩ ලෙස පිළිගැනේ.

ඉහත නිදසුනේදී කළ උපකල්පනයක් වූයේ, ආරම්භක හා අවසාන නොනිම් ඒකක නොමැති බවයි. දැන් අපි සලකා බලනුයේ තාත්වික නිදසුන් වන අතර මෙහිදී, කාලපරිච්ඡේදයක් තුළදී දරන ලද පිරිවැය සම්පූර්ණ කළ ඒකක (එනම් නිමි නිෂ්පාදනය) සහ අසම්පූර්ණ ඒකක (එනම් නොනිමි නිෂ්පාදනය) අතර බෙදාදීම කරනුයේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය කරන්නෙමු.

**අභ්‍යාස 01**

යම්කිසි කාලපරිච්ඡේදයක් තුළදී ඒකක 1,000 ක් පූර්ණ වශයෙන් ද තවත් ඒකක 200 ක් අර්ධ වශයෙන් ද නිමකළ බව උපකල්පනය කරන්න. ආරම්භක නොනිමි තොග නැත.

කාලපරිච්ඡේදය සඳහා දරන ලද පිරිවැය පහත පරිදි වූයේ නම් ඒකකයක පිරිවැය ගණනය කරන්න.

| | රු. |
|---|---|
| මූලික අමුද්‍රව්‍ය | 60,000 |
| අතිරේඛ අමුද්‍රව්‍ය | 10,000 |
| ඍජු ශ්‍රමය | 30,000 |
| නිෂ්පාදන පොදුකාර්ය | 10,000 |
| | 110,000 |

**පිළිතුර**

මුල්ම පියවර ලෙස කළ යුත්තේ, කාලපරිච්ඡේදය තුළදී කළ සම්පූර්ණ නිෂ්පාදනය තීරණය කිරීම සඳහා "සමානුපාතික ඒකක" ගණනය කිරීමයි.

සමානුපාතික ඒකක = භෞතික ඒකක x නිමකළ ප්‍රතිශතය

| | භෞතික ඒකක | නිමි ප්‍රතිශතය (%) | සමානුපාතික ඒකක |
|---|---|---|---|
| පූර්ණ නිමි | 1,000 | 100% | 1,000 |
| අවසාන නොනිමි | 200 | 50% | 100 |
| | 1,200 | | 1,100 |

ඒකකයක පිරිවැය ගණනය කිරීම සඳහා, කාලපරිච්ඡේදය සඳහා වූ මුළු පිරිවැය, සමානුපාතික ඒකක අතර බෙදාදිය යුතුය.

$$\textbf{ඒකකයක පිරිවැය} = \frac{\textbf{මුළු පිරිවැය}}{\textbf{මුළු සමානුපාතික ඒකක}}$$

ඉහත නිදසුනෙහි;

ඒකකයක පිරිවැය = $\frac{110{,}000}{1{,}100}$

= රු. 100

නොනිමි ඒකක, ඒ ඒ පිරිවැය මූලිකාංගයට අදාළව විවිධ මට්ටම් වලට සම්පූර්ණ වී තිබුනේ නම්, එය තව දුරටත් සංකීර්ණ වේ. මෙහිදී ද සමාන මූලධර්ම භාවිත කෙරේ. එනම් ඒ ඒ පිරිවැය මූලිකාංගය සඳහා සමානුපාතික ඒකක වෙන වෙනම හඳුනාගෙන, ඒකකයක පිරිවැය ද වෙන වෙනම හඳුනාගෙන අනතුරුව ඒවා එකතුකිරීම මගින් ඒකකයක මුළු පිරිවැය හඳුනාගැනේ.

**අභ්‍යාස 02**

දී ඇති කාලපරිච්ඡේදයක් සඳහා නිෂ්පාදන, තොග හා පිරිවැය දත්ත පහත පරිදි විය.

| | | රු. |
|---|---|---|
| **මුළු පිරිවැය:** | | |
| මූලික අමුද්‍රව්‍ය | 36,000 | |
| අතිරේඛ අමුද්‍රව්‍ය | | 23,200 |
| ඍජු ශ්‍රමය | | 22,800 |
| නිෂ්පාදන පොදුකාර්ය | | 33,600 |
| | | 115,600 |

| **තොග සහ නිෂ්පාදනය** | **ඒකක** |
|---|---|
| ආරම්භක නොනිමි තොග | - |
| පූර්ණ නිමි ඒකක | 10,000 |
| අර්ධ නිමි අවසන් තොග | 2,000 |

අවසන් නොනිමි ඒකක ඒ ඒ පිරිවැය මූලිකාංගයෙන් පහත පරිදි නිමවී තිබුණි.

| | |
|---|---|
| මූලික අමුද්‍රව්‍ය | 100% |
| අතිරේඛ අමුද්‍රව්‍ය | 80% |
| ඍජු ශ්‍රමය | 70% |
| නිෂ්පාදන පොදුකාර්ය | 60% |

ඔබ කළ යුතු වන්නේ,

(1) සමානුපාතික නිෂ්පාදනය ගණනය කිරීම.

(2) නිමකළ ඒකකයක පිරිවැය

(3) අවසන් නොනිමි ඒකක වල පිරිවැය

**පිළිතුර :**

(1) සහ (2) සමානුපාතික ඒකක ප්‍රකාශය

| පිරිවැය මූලිකාංගය | සමානුපාතික ඒකක | | | මුළු පිරිවැය (රු.) | ඒකකයක පිරිවැය (රු.) | |
|---|---|---|---|---|---|---|
| | නොනිමි | පූර්ණ නිමි | මුළු | | | |
| මූලික අමුද්‍රව්‍ය | 2,000 x 100% = 2,000 | 10,000 | 12,000 | 36,000 | 36,000÷12,000= | 3 |
| අතරේබ අමුද්‍රව්‍ය | 2,000 x 80% = 1,600 | 10,000 | 11,600 | 23,200 | 23,200÷11,600= | 2 |
| ඍජු ශ්‍රමය | 2,000 x 70% = 1,400 | 10,000 | 11,400 | 22,800 | 22,800÷11,400= | 2 |
| නිෂ්. පො/කා | 2,000 x 60% = 1,200 | 10,000 | 11,200 | 33,600 | 33,600÷11,200= | 3 |
| | | | | 115,600 | | 10 |

(3) **අවසන් නොනිමි තොගයේ වටිනාකම (පිරිවැය) :**

| | | | |
|---|---|---|---|
| මූලික අමුද්‍රව්‍ය | - 2,000 x 100% x 3 | = | 6,000 |
| අතිරේඛ අමුද්‍රව්‍ය | - 2,000 x 80% x 2 | = | 3,200 |
| ඍජු ශ්‍රමය | - 2,000 x 70% x 2 | = | 2,800 |
| නිෂ්. පො/කා | - 2,000 x 60% x 3 | = | 3,600 |
| | | | 15,600 |

හෝ

අවසන් නොනිමි තොගයේ පිරිවැය = මුළු පිරිවැය - පූර්ණ නිමි ඒකක වල පිරිවැය

= 115,600 – (10,000 x 10/=)

= 15,600

සටහන් :

- යම් පෙරසැරියක කටයුතු පටන්ගැනීම සඳහා ආරම්භයේදී යොදන අමුද්‍රව්‍ය මූලික අමුද්‍රව්‍ය හෙවත් යෙදවුම් අමුද්‍රව්‍ය වේ. යම් පෙරසැරියක නිමවුම, ඊළඟ පෙරසැරියේ මූලික අමුද්‍රව්‍ය වේ. සාමාන්‍යයෙන් නොනිමි ඒකක වුවද මූලික අමුද්‍රව්‍ය වලින් 100% ක් නිමි ලෙස ගැනේ.

- මූලික අමුද්‍රව්‍ය වලට අමතරව, පෙරසැරිය කෙරීගෙන යන අතරතුරදී යොදන අමුද්‍රව්‍ය අතිරේඛ අමුද්‍රව්‍ය වේ. නොනිමි ඒකක මෙම අමුද්‍රව්‍ය වලින් පූර්ණ ලෙස හෝ අර්ධ ලෙස නිමවී තිබිය හැක.

**ආරම්භක නොනිමි තොග (Opening Work-in-progress)**

යම් කාලපරිච්ඡේදයක අග දිනට නොනිමි ඒකක තිබුනේ නම්, එය ඊළඟ කාලපරිච්ඡේදයේ ආරම්භක කෙරීගෙන යන වැඩ වේ. බොහෝ ප්‍රායෝගික අවස්ථාවන්හිදී පෙරසැරියක් තුළ ආරම්භක මෙන්ම අවසාන නොනිමි ඒකක ද ඇත.

සාමාන්‍යයෙන් කාලයෙන් කාලයට පිරිවැය වෙනස් වන නිසා, ඒ ඒ නිෂ්පාදන කාණ්ඩයට අදාළ ඒකකයක පිරිවැය ද වෙනස් වේ. ආරම්භක නොනිමි ඒකක සඳහා සමානුපාතික නිෂ්පාදනය ගණනය කරන ආකාරය තීරණය වන්නේ, භාවිතා කරන පිරිවැයකරණ ක්‍රමය මතය.

ප්‍රායෝගික භාවිතයේ පවතින පිරිවැයකරණ ක්‍රම 2 කි.

(1) මුලින් ලැබීම් මුලින් පිටවන ක්‍රමය (First – In – First - Out / FIFO)

(2) බරතැබූ සාමාන්‍ය ක්‍රමය (Average Cost Method /AVCO)

**FIFO ක්‍රමය**

නව කාලපරිච්ඡේදයේදී ආරම්භක නොනිමි ඒකක මුලින්ම සම්පූර්ණ කරන බවත්, ඊළඟට පෙරසැරියට කළ යෙදවුම් අනතුරුව සම්පූර්ණ කරන බවත් මෙහිදී උපකල්පනය කෙරේ. මෙහිදී වර්තමාන කාලපරිච්ඡේදයේ අවසාන නොනිමි ඒකක ලෙස ඉතිරිවන්නේ, කාලය තුළ යෙදවුම් කළ නමුත් අවසන් කිරීමට නොහැකි වූ ඒකක වේ.

**අභ්‍යාස 03**

| | ඒකක |
|---|---|
| සෑම අතින්ම 70% ක් නිමි ආරම්භක නොනිමි | 2,000 |
| නිමි තොගයට මාරුකළ | 5,000 |
| සෑම අතින්ම 50% ක් නිමි අවසන් නොනිමි | 3,000 |

කාලපරිච්ඡේදය සඳහා සමානුපාතික ඒකක ගණනය කරන්න.

**පිළිතුර :**

| | | ඒකක |
|---|---|---|
| ආරම්භක නොනිමි නිම කිරීම | (2,000 x 30%) | 600 |
| කාලය තුළ පටන්ගත් හා නිමකළ | (3,000 x 100%) | 3,000 |
| අවසන් නොනිමි ඒකක | (3,000 x 50%) | 1,500 |
| ∴ සමානුපාතික නිෂ්පාදනය | | 5,100 |

**බරතැබූ සාමාන්‍ය ක්‍රමය (Average Cost Method / AVCO Method)**

මෙහිදී, FIFO ක්‍රමයේදී මෙන්, නව කාලපරිච්ඡේදයේදී ආරම්භක නොනිමි ඒකක මුලින්ම නිමකරන බවටත් ඊළඟ යෙදවුම් අනතුරුව නිමකරන බවටත් කළ උපකල්පනය මත පිරිවැයකරණය ආරම්භ නොවේ. ඒ වෙනුවට සියලුම ඒකක, නිෂ්පාදනයේදී එකට සැලකිල්ලට ගන්නා බව පිළිගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ආරම්භක නොනිමි තොගයේ පිරිවැය, කාලය තුළ යෙදවූ හා නිමවූ ඒකක වල පිරිවැයෙන් වෙන් කිරීමක් සිදුනොකරන අතර, ඒවාට, මිශ්‍ර වීමට ඉඩ සැලසේ. ඒවායේ මුළු පිරිවැය, මිශ්‍ර වූ සමස්ථ ඒකක වලින් බෙදා ඒකකයක බර තැබූ සාමාන්‍ය පිරිවැය තීරණය කෙරේ.

**අභ්‍යාස 04**

2014 පෙබරවාරි මාසය සඳහා නිෂ්පාදන ආයතනයක පෙරසැරියකට අදාළව දී ඇති පහත තොරතුරු වලින්,

(1) සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය

(2) පෙරසැරි ගිණුම

සකස් කරන්න.

**නිෂ්පාදන හා තොග වාර්තා :**

- 2014/02/01 දිනට පෙරසැරිය තුළ තිබූ ඒකක (ද්‍රව්‍ය පූර්ණ ලෙස භාවිතා කළ හා ශ්‍රමය හා පොදුකාර්ය වලින් 25% ක් සම්පූර්ණ) 4,000
- පෙබරවාරි මාසය තුළ හඳුන්වා දුන් ඒකක 16,000
- මාසය තුළ නිමකළ ඒකක 14,000
- 2014/02/28 දිනට පෙරසැරිය තුළ තිබූ ඒකක (ද්‍රව්‍ය පූර්ණ ලෙස භාවිතා කළ හා ශ්‍රමය හා පොදුකාර්ය වලින් $33\frac{1}{3}\%$ ක් සම්පූර්ණ) 6,000

**පිරිවැය වාර්තා :**

- 2014/02/01 දිනට ආරම්භක නොනිමි තොග

| | රු. |
|---|---|
| ද්‍රව්‍ය | 6,000 |
| ශ්‍රමය | 1,000 |
| පොදුකාර්ය | 1,000 |
| | 8,000 |

- මාසය සඳහා පිරිවැය

| | |
|---|---|
| ද්‍රව්‍ය | 25,600 |
| ශ්‍රමය | 15,000 |
| පොදුකාර්ය | 15,000 |
| | 55,600 |

- නිෂ්පාදනය තුළ අපතයක් බලාපොරොත්තු නොවූ අතර, සත්‍ය අපතයක් ද ඇති නොවුනි.

**පිළිතුර :**

(1) සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය

| සත්‍ය නිෂ්පාදනය | | | | සමානුපාතික නිෂ්පාදනය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| යෙදවුම් | | නිමවුම් | | ද්‍රව්‍ය | | ශ්‍රමය | | පොදුකාර්ය | |
| | ඒකක | | ඒකක | % | ඒකක | % | ඒකක | % | ඒකක |
| ආර/නොනිමි | 4,000 | පූර්ණ නිමි | 14,000 | 100 | 14,000 | 100 | 14,000 | 100 | 14,000 |
| යෙදවුම් | 16,000 | අව/නොනිමි | 6,000 | 100 | 6,000 | $33\frac{1}{3}$ | 2,000 | $33\frac{1}{3}$ | 2,000 |
| | 20,000 | | 20,000 | | | | | | |
| | | | | | 20,000 | | 16,000 | | 16,000 |
| **පිරිවැය** | | | | | | | | | |
| ආරම්භක නොනිමි | | | | | 6,000 | | 1,000 | | 1,000 |
| මාසය තුළ දරන ලද | | | | | 25,600 | | 15,000 | | 15,000 |
| මුළු පිරිවැය (දළ / ශුද්ධ) | | | | | 31,600 | | 16,000 | | 16,000 |
| සමානුපාතික ඒකකයක පිරිවැය | | | 3.58 | | 1.58 | | 1 | | 1 |
| **අගය කිරීම** | | | | | | | | | |
| පූර්ණ නිමි නිෂ්පාදනය | | | 50,120 | | 22,120 | | 14,000 | | 14,000 |
| අවසන් නොනිමි | | | 13,480 | | 9,480 | | 2,000 | | 2,000 |
| | | | 63,600 | | | | | | |

(2) පෙරසැරි ගිණුම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉ/ගෙ | 4,000 | | 8,000 | නිමි තොගයට මාරු | 14,000 | 3.58 | 50,120 |
| ද්‍රව්‍ය | 16,000 | | 25,600 | ප/ගෙ | 6,000 | | 13,480 |
| ශ්‍රමය | | | 15,000 | | | | |
| පොදුකාර්ය | | | 15,000 | | | | |
| | 20,000 | | 63,600 | | 20,000 | | 63,600 |

**"අතුරු නිෂ්පාදන හා බද්ධ නිෂ්පාදන" (By Products and Joint Products)**

JMC vLearning "your virtual learning partner"

**අභ්‍යාස 05 (පිළිතුරු රහිත)**

සමාගමක් බද්ධ නිෂ්පාදන තුනක් සහ එක් අතුරු නිෂ්පාදනයක් සකස් කරයි. සම්පූර්ණයෙන්ම සකස් කිරීමෙන් පසුව භාණ්ඩ ඒකකයක් අලෙවි කර ගත හැකි මිල මෙසේය.

| | | |
|---|---|---|
| බද්ධ නිෂ්පාදන | ඒ | රු. 17 |
| එම | බී | රු. 13 |
| එම | සී | රු. 36 |
| අතුරු නිෂ්පාදන | ඩී | රු. 9 |

එම භාණ්ඩ සම්පූර්ණයෙන්ම සකස් නොකරන්නේ නම් අලෙවි කරගත හැකි මිල මෙසේය.

ඒ - රු. 8 බී - රු. 4 සී - රු. 10 ඩී - රු. 2

සම්පූර්ණයෙන්ම පිරිපහදු කිරීමේ අතිරේක පිරිවැය

ඒ - රු. 7 බී - රු. 5 සී - රු. 18 ඩී - රු. 8

නිෂ්පාදිත ප්‍රතිශත

ඒ - 40% බී - 30% සී - 20% ඩී - 10%

පසුගිය මාසයේ පෙරසැරි කළ මූලික අමුද්‍රව්‍ය ප්‍රමාණය කිලෝ 100,000 ක් වූ අතර කිලෝවක මිල රු. 4 ක් විය. පැයක වැටුප රු. 1.20 වු අතර පැය 100,000 ක ශ්‍රමය යොදාගන්නා ලදී.

**එක් එක් භාණ්ඩයේ ඒකකයක පිරිවැය සකස් කරන්න.**

**අභ්‍යාස 06 (පිළිතුරු සහිත)**

පහත දී ඇති සංඛ්‍යා තනි නිෂ්පාදන ක්‍රියාවලියකට අදාල වේ. කාල පරිච්ඡේදයේ ආරම්භක දිනට තිබූ කෙරීගෙන යන ඒකක 1,000 කි.

ආරම්භක නොනිම් ඒකකවල වටිනාකම

| | | රු. |
|---|---|---|
| අමුද්‍රව්‍ය | I | 3,900 |
| අමුද්‍රව්‍ය | II | 750 |
| ඍජු ශ්‍රමය | | 1,120 |
| පොදුකාර්ය | | 1,180 |
| | | 6,950 |

සලකා බලන කාල පරිච්ඡේදය තුලදී, තවදුරටත් ඒකක 6,000 ක් පෙරසැරියට යොමුකල අතර ඒවායේ පිරිවැය රු. 23,600 කි.

අනෙකුත් පිරිවැයඃ

| | | රු. |
|---|---|---|
| අමුද්‍රව්‍ය | II | 5,200 |
| ඍජු ශ්‍රමය | | 10,360 |
| පොදුකාර්ය | | 15,410 |

නිමි තොගයට මාරුකල ඒකක : 4,700

කළමනාකරණය අපේක්ෂා කරන අපතය ක්‍රියාකාරී ඒකක වලින් 5% ක් වන අතර, අපතේ යන ඒකකයක් රු. 2.00 බැගින් විකිණිය හැක.

මාසය තුලදී ඒකක 300 ක් අපතේ ගිය අතර ඒවා පහත පරිදි නිව වී තිබුණි.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | II | 100% |
| ඍජු ශ්‍රමය | | 80% |
| පොදුකාර්ය | | 60% |

අවසාන තොගය ඒකක 2,000 ක් වූ අතර ඒවා පහත පරිදි නිව වී තිබුණි.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | II | 60% |
| ඍජු ශ්‍රමය | | 50% |
| පොදුකාර්ය | | 40% |

ඔබ කල යුතු වන්නේ,

(i) බර තැබූ සාමාන්‍ය ක්‍රමයට, "සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය" සකස් කොට ඒකකයක පිරිවැය ගණනය කිරීම.

(ii) පෙරසැරි ගිණුම හා අදාල අනෙකුත් ගිණුම් සකස් කිරීම.

**පිළිතුර 06**

(i) **සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය (AVCO ක්‍රමය)**

| සත්‍ය ඒකක | | | | සමානුපාතික ඒකක | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යෙදවුම් | | නිමවුම් | | අමුද්‍රව්‍ය 1 | | අමුද්‍රව්‍ය 11 | | ඍජු ශ්‍රමය | | පො/කා | |
| | ඒකක | | ඒකක | % | ඒකක | % | ඒකක | % | ඒකක | % | ඒකක |
| ආර/තොග | 1,000 | සාමා. අපතය | 250 | - | - | - | - | - | - | - | - |
| කාලය තුල යෙදවුම් | 6,000 | අසා. අපතය | 50 | 100 | 50 | 100 | 50 | 80 | 40 | 60 | 30 |
| | | නිමි. මාරු | 4,700 | 100 | 4,700 | 100 | 4,700 | 100 | 4,700 | 100 | 4,700 |
| | | අව/තොග | 2,000 | 100 | 2,000 | 60 | 1,200 | 50 | 1,000 | 40 | 800 |
| | 7,000 | | 7,000 | | | | | | | | |
| | | | | | 6,750 | | 5,950 | | 5,740 | | 5,530 |
| **පිරිවැය :** | | | | | | | | | | | |
| ආරම්භක නොනිමි ඒකක වල | | | | | 3,900 | | 750 | | 1,120 | | 1,180 |
| කාලය තුල දරන ලද | | | | | 23,600 | | 5,200 | | 10,360 | | 15,410 |
| මුළු පිරිවැය (දළ) | | | | | 27,500 | | 5,950 | | 11,480 | | 16,590 |
| (-)සාමා.අපතයේ සුන්බුන් අගය(250 x 2) | | | | | (500) | | - | | - | | - |
| මුළු පිරිවැය (ශුද්ධ) | | | | | 27,000 | | 5,950 | | 11,480 | | 16,590 |
| ∴ ඒකකයක පිරිවැය | | | 10 | | 4 | | 1 | | 2 | | 3 |
| **අගය කිරීම :** | | | | | | | | | | | |
| අසාමාන්‍ය අපතය | | | 420 | | 200 | | 50 | | 80 | | 90 |
| නිමි. මාරුකල ඒකක | | | 47,000 | | 18,800 | | 4,700 | | 9,400 | | 14,100 |
| අව. තොගය | | | 13,600 | | 8,000 | | 1,200 | | 2,000 | | 2,400 |

**සටහන් :**

| | | |
|---|---|---|
| (1) | අපතයන් : | **ඒකක** |
| | ආරම්භක නොනිමි | 1,000 |
| | (+) කාලය තුල යෙදවුම් | 6,000 |
| | | 7,000 |
| | (-) අවසන් නොනිමි | (2,000) |
| | ∴ ක්‍රියාකාරී ඒකක | 5,000 |

| | | |
|---|---|---|
| ∴ සාමාන්‍ය අපතය (5,000 x 5%) | = | 250 |
| සත්‍ය අපතය | = | 300 |
| ∴ අසාමාන්‍ය අපතය | = | 50 |

සාමාන්‍යයෙන් මූලික අමුද්‍රව්‍ය (අමුද්‍රව්‍ය 1) පෙරසැරියට හඳුන්වා දෙනුයේ ආරම්භයේදී නිසා, සෑම ඒකකයක්ම මූලික අමුද්‍රව්‍ය වලින් 100% ක් නිමි බව පැහැදිලි වේ.

(ii) **පෙරසැරි ගිණුම**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉ/ගෙ | 1,000 | | 6,950 | සාමා. අපතය | 250 | 2 | 500 |
| යෙදවුම් - අමු 1 | 6,000 | | 23,600 | අසා. අපතය | 50 | | 420 |
| යෙදවුම් - අමු 11 | | | 5,200 | නිමි තොගයට මාරු | 4,700 | 10 | 47,000 |
| ඍජු ශ්‍රමය | | | 10,360 | ප/ගෙ | 2,000 | | 13,600 |
| පොදුකාර්ය | | | 15,410 | | | | |
| | 7,000 | | 61,520 | | 7,000 | | 61,520 |

**සාමාන්‍ය අපතය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පෙරසැරි | 250 | 2 | 500 | | | | |
| අසාමාන්‍ය අපතය | 50 | 2 | 100 | මුදල් | 300 | 2 | 600 |
| | 300 | | 600 | | 300 | | 600 |

**අසාමාන්‍ය අපතය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පෙරසැරි | 50 | | 420 | සාමා. අපතය | 50 | 2 | 100 |
| | | | | පිරිවැය ලා/ලා | | | 320 |
| | 50 | | 420 | | 50 | | 420 |

## අභ්‍යාස (පිළිතුරු රහිත)

**අභ්‍යාස 07**

"කේ" නම් භාණ්ඩය එක් ක්‍රියාවලියකින් අවසන් කරනු ලැබේ. ජනවාරි මාසය ආරම්භයේ මෙම ක්‍රියාවලියේ කෙරීගෙන යන ඒකක නොතිබිණි. ජනවාරි මාසයේ ක්‍රියාවලිය හා සම්බන්ධ ඒකක මෙසේය.

ක්‍රියාවලියට එක් කරන ලද ඒකක 12,000 පිරිවැය රු. 34,850
ඉවත දැමූ ඒකක 1,250

ඉවත දැමූ ඒකකයක් පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 80% |
| ශ්‍රමය | 70% |
| පොදුකාර්ය | 70% |

ඉවත දමන ඒකකයක් රු. 2.00 ක් ගණනේ විකිණිය හැකිය. මාසය තුළදී ඒකක 10,250 ක් සම්පූර්ණයෙන්ම නිමවන ලදී.

කාලය තුළ අනෙකුත් පිරිවැය මෙසේය.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 21,360 |
| ශ්‍රමය | 10,620 |
| පොදුකාර්ය | 31,860 |

අවසන් තොගය ඒකක 500 ක් විය. තොගයේ ඒකකයක් පහත සඳහන් පරිදි නිමවී තිබිණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 70% |
| ශ්‍රමය | 60% |
| පොදුකාර්ය | 60% |

මෙම ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම 10% කි. ක්‍රියාවලි ගිණුම් සකස් කරන්න.

**අභ්‍යාස 08**

"කේ" භාණ්ඩය පිළිබඳ පෙබරවාරි මාසයේ විස්තර මෙසේය. මාසය ආරම්භයේ කෙරීගෙන යන ඒකක 500 කි. පිරිවැය රු. 3,400 කි. මෙම ඒකක පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 70% |
| ශ්‍රමය | 60% |
| පොදුකාර්ය | 60% |

ක්‍රියාවලියට ඇතුලත් කළ ඒකක 15,000 පිරිවැය රු. 43,600
ඉවත දමූ ඒකක 1,370 කි.

ඉවත දමූ ඒකක පහත සඳහන් පරිදි නිමවී තිබුණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 90% |
| ශ්‍රමය | 80% |
| පොදුකාර්ය | 80% |

ඉවත දමන ලද ඒකකයක් රු. 2.00 ක් ගණනේ විකිණිය හැක. මාසය තුළදී ඒකක 12,630 ක් නිමවූ තොගයට යවන ලදී. මාසයේ වියදම් මෙසේය.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 26,300 |
| ශ්‍රමය | 14,355 |
| පොදුකාර්ය | 40,455 |

අවසාන තොගය ඒකක 1,500 කි. අවසාන තොගයේ ඒකකයක් පහත සඳහන් පරිදි නිමවී තිබුණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 60% |
| ශ්‍රමය | 50% |
| පොදුකාර්ය | 50% |

ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම 10%

ක්‍රියාවලියේ ගිණුම් සකස් කරන්න.

**අභ්‍යාස 09**

"කේ" භාණ්ඩය පිළිබඳ මාර්තු මාසයේ විස්තර මෙසේය.

මාසයේ ආරම්භයේදී කෙරීගෙන යන ඒකක 1,500 කි. පිරිවැය රු. 9,450 කි. මෙම තොගය පහත සඳහන් පරිදි නම් වී තිබුණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 60% |
| ශ්‍රමය | 50% |
| පොදුකාර්ය | 50% |

මාර්තු මාසයේදී ක්‍රියාවලියට ඇතුලත් කළ ඒකක 16,500 කි.
පිරිවැය රු. 48,000

ඉවත දැමූ ඒකක 1,550 කි. ඉවත දැමූ ඒකක පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 80% |
| ශ්‍රමය | 70% |
| පොදුකාර්ය | 70% |

ඉවතදමන ඒකකයක් රු. 2.00 ගණනේ විකිණිය හැක. මාසයක් තුළදී ඒකක 13,450 ක් නිමි භාණ්ඩ තොගයට මාරු කරන ලදී. මාසයේ වියදම් මෙසේය.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | රු. 30,849 |
| ශ්‍රමය | රු. 13,081.50 |
| පොදුකාර්ය | රු. 56,686.50 |

අවසාන තොගය ඒකක 3,000 ක් විය. අවසාන තොගයේ ඒකකයක් පහත සඳහන් පරිදි නිමවී තිබිණි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 70% |
| ශ්‍රමය | 60% |
| පොදුකාර්ය | 60% |
| ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම | 10% |

ක්‍රියාවලියේ ගිණුම් සකස් කරන්න.

**අභ්‍යාස 10**
එක්තරා මාසයක අංක 3 ක්‍රියාවලිය පිළිබඳ විස්තර මෙසේය.

| | | |
|---|---|---|
| ආරම්භක ඒකක | 1,000 | |
| එහි වටිනාකම | | |
| සෘජු ද්‍රව්‍ය | 1 | 390 |
| සෘජු ද්‍රව්‍ය | 11 | 75 |
| සෘජු ශ්‍රමය | | 112 |
| පොදුකාර්ය | | 118 |
| | | 695 |

| | |
|---|---|
| අංක 02 ක්‍රියාවලියෙන් ලැබීම් ඒකක 6,000 | රු. 2,360 |
| අංක 04 ක්‍රියාවලියට යැවීම් ඒකක 4,700 | |
| අංක 03 ක්‍රියාවලියේදී එකතු කළ සෘජු ද්‍රව්‍ය 11 | 520 |
| ශ්‍රමය | 1,036 |
| පොදුකාර්ය | 1,541 |

ඉවත දැමූ ඒකක 300 එම ඒකක පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 100% |
| සෘජු ශ්‍රමය | 80% |
| පොදුකාර්ය | 60% |

අවසන් තොගය ඒකක 2,000 ක් වූ අතර එම ඒකක පහත සඳහන් පරිදි අවසන් වී තිබිණි.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 60% |
| සෘජු ශ්‍රමය | 50% |
| පොදුකාර්ය | 40% |

සාමාන්‍ය අපතේ යෑම 5% ක් වන අතර එම ඒකකයක් රු. 0.20 ගණනේ විකිණිය හැක. නිෂ්පාදනයට අවශ්‍ය තොග නිකුත් කරන්නේ සාමාන්‍ය මිල මතය.

ගිණුම් සකස් කරන්න.

**අභ්‍යාස 11**
නිෂ්පාදන අංක 02 ක්‍රියාවලිය හා සම්බන්ධ විස්තර මෙසේය.

ආරම්භක තොගය ඒකක 600 පිරිවැය රු. 105

ආරම්භක තොගය පහත සඳහන් පරිදි අවසන් වී ඇත.

| | |
|---|---|
| ඍජු ද්‍රව්‍ය | 50% |
| ඍජු ශ්‍රමය | 60% |
| පොදුකාර්ය | 60% |

අංක 1 ක්‍රියාවලියෙන් යොමු කළ ඒකක 11,000 පිරිවැය 550
අංක 3 ක්‍රියාවලියට යොමුකළ ඒකක 8,800

අංක 2 ක්‍රියාවලියේදී පහත සඳහන් වියදම් දරා ඇත.

| | |
|---|---|
| ඍජු ද්‍රව්‍ය | 245.50 |
| ඍජු ශ්‍රමය | 715.50 |
| පොදුකාර්ය | 954 |

ඉවත දැමූ ඒකක 1,200 ක් වූ අතර එම එක් ඒකකයක් පහත සඳහන් පරිදි නිම වී තිබිණි.

| | |
|---|---|
| ඍජු ද්‍රව්‍ය | 100% |
| ශ්‍රමය | 70% |
| පොදුකාර්ය | 70% |

අවසන් කෙරීගෙන යන බඩු තොග ඒකක 1,600 කි. එම ඒකකයක් පහත සඳහන් පරිදි නිම වී තිබේ.

| | |
|---|---|
| ඍජු ද්‍රව්‍ය | 70% |
| ඍජු ශ්‍රමය | 60% |
| පොදුකාර්ය | 60% |

මෙම ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම 10% කි. අපතේ යන ඒකකයක් රු. 0.05 ගණනේ විකුණාගත හැක. ගිණුම් පිළියෙල කළ හැක්කේ කලින් ලැබීම්, කලින් ක්‍රමය මතය.

ගිණුම් සකස් කරන්න.

**අභ්‍යාස 12**
සමාගමක් බද්ධ නිෂ්පාදන තුනක් සහ එක් අතුරු නිෂ්පාදනයක් සකස් කරයි. සියලුම භාණ්ඩ අඩක් සකස් කිරීමෙන් පසුවද අලෙවි කරගත හැකිය. විස්තර මෙසේය.

| භාණ්ඩය | | නිෂ්පාදන ප්‍රතිශතය | අවසාන විකුණුම් මිල | අතරතුර විකුණුම් මිල | අතිරේක පිරිපහදු වියදම් |
|---|---|---|---|---|---|
| බද්ධ නිෂ්පාදන | A | 40% | 57 | 38 | 14 |
| එම | B | 30% | 43 | 24 | 10 |
| එම | C | 20% | 83 | 30 | 36 |
| අතුරු නිෂ්පාදන | D | 10% | 25 | 12 | 16 |

කුමන තත්ත්වයෙන් අලෙවි කළද මෙම භාණ්ඩ අලෙවි කිරීමට පෙර භාජනයක දැමිය යුතුය. සම්පූර්ණයෙන්ම සකස් කළ භාණ්ඩ ඒකකයක් සඳහා අවශ්‍ය භාජනයේ මිල රු. 3 කි. අඩක් සකස් කළ භාණ්ඩ ඒකකයක් සඳහා අවශ්‍ය භාජනයක මිල රු. 2 කි. පසුගිය මාසයේ වියදම්,

අමුද්‍රව්‍ය කිලෝවක් රු. 8 ගණනේ කිලෝ 100,000 කි.
ශ්‍රම පැයකට රු. 2.50 ක් ගණනේ පැය 85,000 කි.
ස්ථාවර පොදුකාර්ය රු. 2,000,000

එක් එක් භාණ්ඩයේ ඒකකයක සහභාගය සහ පසුගිය මාසයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.

**අභ්‍යාස 13**
සමාගමක් පිළිවෙලින් ඒඒ බීබී සහ සීසී නමින් හඳුන්වන බද්ධ නිෂ්පාදන දෙකක් සහ අතුරු නිෂ්පාදනයක් සකස් කරයි.

පෙරසැරි විස්තර පහත සඳහන් පරිදිය.

**<u>පළමු පෙරසැරිය</u>**
දියර දෙකක් වන ඒ සහ බී 4 : 1 අනුපාතයට මිශ්‍ර කෙරේ. මිශ්‍ර කිරීමේ සාමාන්‍ය අපතය 10% කි. නිෂ්පාදනයන් මෙසේ වෙන්කර ගනු ලැබේ.

50% ක් සකස් කළ අංක 1 දියරය ලෙස
40% සකස් කළ අංක 11 දියරය ලෙස
10% අතුරු නිෂ්පාදනය ලෙස
සකස් කළ දියර දෙවැනි පෙරසැරියට මාරු කෙරේ.

**<u>දෙවන පෙරසැරිය</u>**
සකස් කළ අංක 1 දියරය සමග "C" දියරය 3 : 1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් ඒඒ නිෂ්පාදනය සකස් කෙරේ.
සකස් කළ අංක 11 දියරය සමග "D" දියරය 4 : 1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් බීබී නිෂ්පාදනය සකස් කෙරේ.

දියර ලීටරයක මිල

| | |
|---|---|
| ඒ - රු. 4.00 | බී - රු. 2.00 |
| සී - රු. 5.00 | ඩී - රු. 6.00 |

පෙරසැරියට යොමුකළ දියර ලීටරයක් පිරිපහදු කිරීමේ පිරිවැය

| | |
|---|---|
| අංක 1 පෙරසැරියට | රු. 2.50 |
| අංක 11 පෙරසැරියට | රු. 3.00 |

හිස් භාජනයක මිල

| | |
|---|---|
| ඒඒ | රු. 2.00 |
| බීබී | රු. 1.50 |
| සීසී | රු. 0.50 |

පසුගිය සතියේ සීසී නිෂ්පාදනය ලීටර් 810 විය. සීසී ලීටරයක් රු. 16.50 ගණනේ විකුණන ලදී.

නිෂ්පාදන ලීටරයක පිරිවැය කිට්ටුම සතයට ගණනය කරන්න.